## චතුත්ථො පාඨො

# වාරණරාජා

එකස්මිං කිර සමයෙ ලඞ්කායං දුට්ඨගාමිණී අභයො නාම රාජා රජ්ජං කාරෙසි. තදා තස්ස තිස්සො නාමෙකො චූළූපට්ඨාකො අබ්භන්තරිකො හුත්වා රාජකම්මං කරොති. තදා රඤ්ඤො කණ්ඩුලො නාම වාරණො නිගළඤ්ච ආලානඤ්ච භින්දිත්වා පාචීනපස්සං ගන්ත්වා වනං පවිසිත්වා කිසලපත්තාදයො ඡින්දිත්වා භින්දිත්වා ඛාදන්තො අනුක්කමෙන මහානිජ්ඣරවිහාරං ගන්ත්වා තෙසු තෙසු ඨානෙසු රුක්ඛමූලිකසුඤ්ඤාගාරිකාදයො යුත්තයොගෙ ඣානංගධරෙ භික්ඛූ දිස්වා පසන්නමානසො තෙසං ඵලාඵලාදයො ආහරිත්වා උපට්ඨානං කරොන්තො විහාසි. රාජා කිර තං හත්ථිනං ගතට්ඨානං උපපරික්ඛාපෙන්තො අදිස්වා චත්තාරො අමච්චෙ චතුද්දිසං පෙසෙන්තො චූළූපට්ඨාකතිස්සාමච්චං පාචීනපස්සං පෙසෙසි. සෙසදිසාසු ගතා හත්ථිං න පස්සිංසු. සො පනෙස අමච්චො ගාමනිගමපරම්පරාය විචරන්තො තමෙව විහාරං සම්පාපුණි. තතො කණ්ඩුලො නාම වාරණරාජා තදා සුපක්කං කාරඵලසහිතං කාරසාඛං භින්දිත්වා භික්ඛූනං පතිගණ්හාපෙසි. අමච්චො රඤ්ඤො සන්තිකං ගන්ත්වා දෙව, නිජ්ඣරවිහාරෙ භික්ඛූනො වෙය්‍යාවච්චං කරොන්තො හත්ථිනාගො මයා දිට්ඨොති කථෙසි. තං සුත්වා රාජා ත්වමෙව භණෙ හත්ථිං ගහෙත්වා ආගච්ඡාහීති නියොජෙසි.

(චූලතිස්සවත්ථු රසවාහිනී)

පද මාලාව

| | | | |
|---|---|---|---|
| **චූළූපට්ඨාකො** | **(ස)** | - | සුළු සේවකයෙක් |
| **අබ්භන්තරිකො** | **(ත)** | - | ඉතා විශ්වාස කටයුතු |
| **රාජකම්මං** | **(ස)** | - | රජගෙදර කටයුතු |
| **වාරණො** | **(නා)** | - | ඇතා |
| **නිගළඤ්ච** | **(සං)** | - | ඇතුන් බඳින දම්වැල ද |
| **ආලානඤ්ච** | **(සං)** | - | ඇතුන් බඳින කණුව ද |
| **පාචීනපස්සං** | **(නා)** | - | නැගෙනහිර දිසාව |
| **කිසලපත්තාදයො** | **(සං)** | - | දළුකොළ ආදිය |
| **යුත්තයොගො** | **(ස)** | - | යෝග භාවනාවෙහි යෙදුණු |
| **ඣානංගධරෙ** | **(ස)** | - | ධ්‍යානංගධාරී |
| **පසන්නමානසො** | **(ස)** | - | පහන් සිතැත්තේ |
| **විහාසි** | **(ක්‍රි)** | - | වාසය කළේ ය |
| **උපපරික්ඛාපෙන්තො** | **(කි)** | - | සොයා බලන්නේ |
| **ඵලාඵලාදයො** | **(ස)** | - | පලවැල ආදිය |
| **ගතට්ඨානං** | **(ස)** | - | ගියා වූ ස්ථානය |

| | | | |
|---|---|---|---|
| **සෙසදිසාසු** | **(ස)** | - | සෙසු දිසාවන්හි |
| **ගාමනිගම** | **(ස)** | - | ගම් නියම්ගම් |
| **සුපක්කං** | **(කි)** | - | මනාව ඉදුණු |
| **කාරඵල** | **(ස)** | - | කරගෙඩි |
| **කාරසාඛං** | **(ස)** | - | කරඅත්තක් |
| **වෙය්‍යාවච්චං** | **(ස)** | - | උපස්ථානය |
| **හත්ථිනාගො** | **(ස)** | - | ඇත්රජු |
| **දිට්ඨො** | **(කි)** | - | දක්නා ලදී |
| **නියොජෙසි** | **(ක්‍රි)** | - | යෙදවී ය |

**අභ්‍යාස**

1. වාරණරාජා යන ඡේදය සිංහලට නගන්න.

2. පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. කො නාම රාජා තදා ලංකායං රජ්ජං කාරෙසි ?
ii. වාරණො තෙසු තෙසු ඨානෙසු කිං අපස්සි ?
iii. රාජා ගජං උපපරික්ඛිතුං කති අමච්චෙ පෙසෙසි ?
iv. වාරණරාජා භික්ඛූනං කානි පතිගණ්හාපෙසි ?
v. වාරණරාජා කෙසං උපට්ඨානං අකාසි ?

3. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. දුටුගැමුණු රජුගේ විශ්වාසදායී සුළු සේවකයාගේ නම කුමක් ද?
ii. දුටුගැමුණු රජුගේ ඇතාගේ නම කුමක් ද ?
iii. භාවනාවට යෝග්‍ය ස්ථාන මොනවා ද?
iv. බුදුරජාණන් වහන්සේට තිරිසන් සතුන් විසින් උපස්ථාන කළ අවස්ථාවන් සඳහන් කරන්න.
v. සතර දිසාවන් නම් කරන්න.

## ආඛ්‍යාතය I

කිසියම් වීමක් හෝ කිරීමක් හැඟවෙන පද **ආඛ්‍යාත** නම් වෙයි. අර්ථවත් කථනය සහ ලේඛනය සඳහා ආඛ්‍යාතය අත්‍යන්තයෙන් උපකාරී වෙයි. පාලි ආඛ්‍යාත පදයන්ගේ සාමාන්‍ය ලක්ෂණ මෙසේ ය.

"**යං තිකාලං තිපුරිසං ක්‍රියාවාචී තිකාරකං**
**අත්තිලිංගං ද්විවචනං තදා'ඛ්‍යාතනති වුච්චති.**" ඒ අනුව ආඛ්‍යාතය

**කාල තුනකින් යුක්ත ය.** - වර්තමාන කාල, අතීත කාල, අනාගත කාල වශයෙනි.

**පුරිස තුනකින් යුක්තය.** - පඨම පුරිස, මජ්ඣිම පුරිස, උත්තම පුරිස වශයෙනි.

**ක්‍රියාවාචී.** - යම්කිසි වීමක්/කිරීමක් ඇඟවීම ක්‍රියා වාචී නම් වේ.

**කාරක තුනකින් යුක්තය.** - කර්තෘ කාරක, කර්ම කාරක, භාව කාරක යනුවෙනි.

**ආඛ්‍යාතය ලිංග භජනය නො කරයි.**
වචන දෙකකින් යුක්ත ය. - ඒක වචන, බහු වචන වශයෙනි.

මෙසේ කාල පුරුෂ ආදී වශයෙන් යෙදෙන ආඛ්‍යාතයන්හි මූලය හඳුන්වනුයේ **ධාතු** යන නමිනි. ධාතුන් වරනැගෙන ස්වරූපය සලකා භූවාදී ගණ ආදී වශයෙන් ප්‍රභේදගත වෙයි. ධාතුමංජුසාවේ දැක්වෙන්නේ එබඳු ක්‍රියා මූලයන් ය.

| | | | |
|---|---|---|---|
| **පච** | - **පාකෙ** | - **පච ධාතුව** | - **පිසීමෙහි** |
| **සප්ප** | - **ගතිම්හි** | - **සප්ප ධාතුව** | - **ගමනෙහි** |
| **සු** | - **සවණෙ** | - **සු ධාතුව** | - **ඇසීමෙහි** |
| **රඤ්ජ** | - **රාගෙ** | - **රඤ්ජ ධාතුව** | - **සායම් කිරීමෙහි** |
| **මුච** | - **මොචනෙ** | - **මුච ධාතුව** | - **මිදීමෙහි** |

මේ ආදී ධාතුමූලයන් ක්‍රියා විභක්තීන්හි වරනැගේ. විවිධාර්ථ නිපදවන එබඳු ආඛ්‍යාත විභක්ති 8ක් පාලි භාෂාවේ ඇත. ඒවා මෙසේ ය.

**වත්තමානා**
**අජ්ජතනී**
**භවිස්සන්ති**
**පඤ්චමී**
**සත්තමී**
**පරොක්ඛා**
**හීයත්තනී**
**කාලාතිපත්ති**

මෙම ක්‍රියා විභක්ති 8 අතුරෙන් මෙහි දී අවධානයට ලක්වන්නේ **වර්තමාන අජ්ජතනී** හා **භවිස්සන්ති** යන කාලත්‍රයට අයත් ක්‍රියා විභක්තීන් ය. විවිධ ධාතුන් ඒ ඒ ක්‍රියා විභක්තීන්හි වගුගත කිරීම හා අර්ථ ගැන්වීම පහත සඳහන් පරිදි වේ.

## වත්තමානා ආඛ්‍යාතය

වර්තමාන කාලය යනු දැන් පවතින කාලය යි. එම කාලයට අයත් ක්‍රියා ප්‍රත්‍යය හා වරනැගීම පහත පරිදි වේ.

### වත්තමානකාල කත්තරි පරස්සපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියාපදය | ප්‍රත්‍ය | ක්‍රියාපදය |
| පඨම පුරිස | ති | පචති | න්ති | පචන්ති |
| මජ්ඣිම පුරිස | සි | පචසි | ථ | පචථ |
| උත්තම පුරිස | මි | පචාමි | ම | පචාම |

### වත්තමාන කාල කත්තරි පරස්සපද වාක්‍ය

සො ඔදනං පචති. - ඔහු බත පිසයි.
තෙ ඔදනං පචන්ති. - ඔවුහු බත පිසති.
ත්වං ඔදනං පචසි. - නුඹ බත පිසහි.
තුම්හෙ ඔදනං පචථ. - නුඹලා බත පිසහු.
අහං ඔදනං පචාමි. - මම බත පිසමි.
මයං ඔදනං පචාම. - අපි බත පිසමු.

### වත්තමානකාල කත්තරි අත්තනොපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියාපදය | ප්‍රත්‍ය | ක්‍රියාපදය |
| පඨම පුරිස | තෙ | පචතෙ | න්තෙ | පචන්තෙ |
| මජ්ඣිම පුරිස | සෙ | පචසෙ | වෙහ | පචවෙහ |
| උත්තම පුරිස | ඒ | පචෙ | මෙහ | පචාමෙහ |

### වර්තමාන කාල කත්තරි අත්තනොපද වාක්‍යය

සො ඔදනං පචතෙ. - හේ බත පිසයි.
තෙ ඔදනං පචන්තෙ. - ඔවුහු බත පිසති.

ත්වං ඔදනං පචසෙ. - නුඹ බත පිසහි.
තුම්හෙ ඔදනං පචවෙහ. - නුඹලා බත පිසහු.

අහං ඔදනං පචෙ. - මම බත පිසමි.
මයං ඔදනං පචාමෙහ. - අපි බත පිසමු.

## අජ්ජතනී ආඛ්‍යාතය

අතීත කාලය යනු ගෙවී ගිය කාලය යි. එම කාලයට අයත් ක්‍රියා පද හැඟවීම සඳහා අජ්ජතනී ආඛ්‍යාතය යෙදෙයි.

### අතීතකාල කත්තරි පරස්සපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ඊ | අපචි/පචි<br>අපචී/පචී | උං | අපචිංසු / පචිංසු<br>අපචුං/පචුං |
| **මජ්ඣිම පුරිස** | ඔ | අපචො/පචො | ත්ථ | අපචිත්ථ/පචිත්ථ |
| **උත්තම පුරිස** | ඉං | අපචිං / පචිං | මහා | අපචිමහ/පචිමහ<br>අපචිමහා/පචිමහා |

### අතීත කාල කත්තරි පරස්සපද වාක්‍යය

සො ඔදනං පචී. - ඔහු බත පිසීය.
තෙ ඔදනං පචුං. - ඔවුහු බත පිසූහ.
ත්වං ඔදනං පචො. - නුඹ බත පිසූවෙහි.
තුමෙහ ඔදනං පචිත්ථ. - නුඹලා බත පිසූවෙහු.
අහං ඔදනං පචිං. - මම බත පිසුවෙමි.
මයං ඔදනං පචිමහා. - අපි බත් පිසුවෙමු.

### අතීත කාල කත්තරි අත්තනොපද

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ආ | අපචා /පචා/<br>අපචිත්ථ/ පචිත්ථ | ඌ | අපචූ / පචූ |
| **මජ්ඣිම පුරිස** | සෙ | අපචිසෙ/පචිසෙ | වහං | අපචිවහං/ පචිවහං |
| **උත්තම පුරිස** | අ | අපචං / පචං /<br>අපච / පච | මෙහ | අපචිමෙහ/පචිමෙහ |

සො ඔදනං අපචා. - හේ බත පිසී.
තෙ ඔදනං අපචූ. - ඔවුහු බත පිසී.

ත්‍වං ඔදනං අපචිසෙ. - නුඹ බත පිසිහි.
තුමෙහ ඔදනං අපචිවහං. - තෙපි බත පිසූහු.

අහං ඔදනං පච. - මම බත පිසීමි.
මයං ඔදනං පචිමෙහ. - අපි බත පිසූමු.

**භවිස්සන්ති ආඛ්‍යාතය**

අනාගත කාලය යනු නොපැමිණි කාලය යි. එම කාලයට අයත් ක්‍රියා පද හැඟවීම සඳහා පහත ප්‍රත්‍යය යොදා ගනියි.

**අනාගත කාල කත්තරි පරස්සපද**

| පුරිස | එකවචන | | බහුවචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ස්සති | පචිස්සති | ස්සන්ති | පචිස්සන්ති |
| **මජ්ඣිම පුරිස** | ස්සසි | පචිස්සසි | ස්සථ | පචිස්සථ |
| **උත්තම පුරිස** | ස්සාමි | පචිස්සාමි | ස්සාම | පචිස්සාම |

**අනාගතකාල කත්තරි පරස්සපද වාක්‍යය**

සො ඔදනං පචිස්සති - ඔහු බත පිසන්නේ ය.
තෙ ඔදනං පචිස්සන්ති - ඔවුහු බත පිසන්නෝ ය.
ත්‍වං ඔදනං පචිස්සසි - නුඹ බත පිසන්නෙහි.
තුමෙහ ඔදනං පචිස්සථ - නුඹලා බත පිසන්නෙහු.
අහං ඔදනං පචිස්සාමි - මම බත පිසන්නෙමි.
මයං ඔදනං පචිස්සාම - අපි බත පිසන්නෙමු.

**අනාගතකාල කත්තරි අත්තනොපද**

| පුරිස | එක වචන | | බහු වචන | |
|---|---|---|---|---|
| | ප්‍රත්‍ය | ක්‍රියා පදය | ප්‍රත්‍ය | ක්‍රියා පදය |
| **පඨම පුරිස** | ස්සතෙ | පචිස්සතෙ | ස්සන්තෙ | පචිස්සන්තෙ |
| **මජ්ඣිම පුරිස** | ස්සසෙ | පචිස්සසෙ | ස්සවෙහ | පචිස්සවෙහ |
| **උත්තම පුරිස** | ස්සං | පචිස්සං | ස්සාමෙහ | පචිස්සාමෙහ |

## අනාගතකාල කත්තරි අත්තනොපද වාක්‍ය

| | | |
|---|---|---|
| සො ඔදනං පචිස්සතෙ | - | හේ බත පිසන්නේ ය. |
| තෙ ඔදනං පචිස්සන්තෙ | - | ඔවුහු බත පිසන්නෝ ය. |
| ත්වං ඔදනං පචිස්සසෙ | - | නුඹ බත පිසන්නෙහි ය. |
| තුම්හෙ ඔදනං පචිස්සව්හෙ | - | නුඹලා බත පිසන්නෙහුය. |
| අහං ඔදනං පචිස්සං | - | මම බත පිසන්නෙමි. |
| මයං ඔදනං පචිස්සාම්හෙ | - | අපි බත පිසන්නෙමු. |

### අභ්‍යාස

1. පහත සඳහන් ඒකවචන ක්‍රියාපද බහුවචනයට හරවන්න.

i. කාරෙසි -
ii. පචිස්සති -
iii. භින්දිං -
iv. පස්සි -
v. ආහරිස්සති -
vi. පෙසෙසි -
vii. සම්පාපුණි -
viii. සුණො -
ix. භින්දිස්සං -
x. පතිගණ්හාපෙසි -

2. පහත වාක්‍ය අතීත හා අනාගත කාලයට හරවා ලියන්න. අර්ථය ද ලියන්න.

i. සොමපාලො නාමෙකො උපාසකො අබ්භන්තරිකො හුත්වා ථෙරස්ස වෙය්‍යාවච්චං කරොති.
ii. පරිවෙණෙ සාමණෙරා තෙසු තෙසු ඨානෙසු නිසීදිත්වා පොත්ථකානි පඨන්ති.
iii. සංචාරකජනා ගාමනිගමරාධානීසු විචරිත්වා කොළම්බනගරමෙව පාපුණන්ති.
iv. මයං පසන්නමනසා එලාඑලාදයො ආහරිත්වා භික්ඛූනං පූජෙම.
v. තුම්හෙ චතුද්දිසං ගන්ත්වා චොරෙ උපපරික්ඛථ.

3. හිස්තැනට සුදුසු ක්‍රියාපදය යොදා මෙම වාක්‍යය සිංහලට නගන්න.

(පටිසෙවාමි, වන්දෙ, ආමන්තෙසි, අභිනන්දුං, අනුස්සරෙථ)

i. තත්‍ර ඛො භගවා පඤ්චවග්ගියෙ භික්ඛූ --------------
ii. අත්තමනා පඤ්චවග්ගියා භික්ඛූ භගවතො භාසිතං ----------------
iii. --------- සම්බුද්ධං භයං තුම්හාකං නො සියා
iv. පටිසංඛායොනිසො සෙනාසනං ---------
v. අහං ------------ තං බොධිපාදපං

4. පාලියට නගන්න.

i. මම හැමදා ම පිරිවෙණට යමි.
ii. අපි සියලු දෙනා ම දිනපතා බුදුන් වඳිමු.
iii. ඔබ ගෙදර යන්න කැමති ද ?
iv. නුඹලා මවුපියන්ට සලකනු.
v. ඔබ පාලි භාෂාව ඉගෙනීමට කැමති වන්නෙහි ද?

5. සිංහලට නගන්න.

i. රාජානො අත්තානං කුමාරෙ නා නා සිප්පානි සික්ඛාපෙසුං.
ii. මනුස්සා ආයුක්ඛයෙන ච පුඤ්ඤක්ඛයෙන මරන්ති.
iii. 'තයො මෙ භික්ඛවෙ ගිලානා සංවිජ්ජමානා ලොකස්මිං'
iv. අනාථපිණ්ඩිකො නිබද්ධං දිවසස්ස ද්වෙ වාරෙ තථාගතස්සුපට්ඨානං ගච්ඡති.
v. බොධිසත්තො භාතිකසතස්ස කනිට්ඨො අහොසි.